# සිංහල සාහිත්‍යය කෙරෙහි පැවති ද්‍රවිඩ ආභාසය

ඩී. කේ. සඳුනි ෂශිප්‍රභා
විශේෂවේදී තෙවන වසර
ඉතිහාස අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
sandunisashiprbha@gmail.com

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ සිංහල ද්‍රවිඩ සම්බන්ධතාවල ඉතිහාසය ක්‍රි. පූ. මුල් යුගය දක්වා ඈතට දිව යයි. අප අසල්වැසියන් වන ද්‍රවිඩ ජාතිකයන් සමඟ අතීතයේ පටන් සතුරු මිතුරුකම් ආවාහ විවාහ සබඳකම් කාලයක් පටන් පැවත ආ බව ඉතිහාසය කෙරෙහි අවධානය යොමු කිරීමේදී පැහැදිලි වේ. එය වර්තමානයේ වුවද වෙනස් මුහුණුවරක් ගනිමින් පැවත ඒම දක්නට ලැබේ. මෙම තත්වය ශ්‍රී ලංකාවේ ගෘහ නිර්මාණ ශිල්පය, මූර්ති කලාව, කැටයම්, චත් පිළිවෙත්, ආගමික සංකල්ප හා විශ්වාස මෙන්ම සාහිත්‍ය තුළින් ද ගම්‍ය වේ. මෙම අධ්‍යයනයේ දී මූලික වශයෙන් අරමුණු කර ගනු ලබන්නේ ශ්‍රී ලංකාවේ සිංහල සාහිත්‍යය කෙරෙහි පැවති ද්‍රවිඩ ආභාසය පිළිබඳ සොයා බැලීම යි. ඒ සඳහා ප්‍රාථමික මූලාශ්‍රය හා දකුණු ඉන්දීය ද්‍රවිඩ ග්‍රන්ථ මෙන්ම ජන සාහිත්‍යය ද යොදා ගැනේ. ඊට අමතරව අධ්‍යයනයට අදාළ ද්විතීය මූලාශ්‍රය කෙරෙහි ද අවධානය යොමු කෙරේ.

ශ්‍රී ලංකාවට වරින් වර දකුණු ඉන්දියාව හරහා සිදුවූ සංක්‍රමණ හා ආක්‍රමණ මෙන්ම මෙරට හා දකුණු ඉන්දීය රාජ්‍යයන් සමඟ පැවති සබඳකම් හේතුවෙන් සිංහල සාහිත්‍යයට එකතු වූ විවිධ අංශයන්, දකුණු ඉන්දියාවෙන් මෙරටට සංක්‍රමණය වූ ආගමික විශ්වාසයන් මත ගොඩනැගුනා වූ ආගමික සාහිත්‍යක් ද, ලාංකීය සාහිත්‍යයට එක් වූ බව හඳුනාගත හැකි විය. මුල් යුගයේ සිට සිංහල සාහිත්‍ය දෙස අවධානය යොමු කරන විට පොළොන්නරු යුගයේ දී ප්‍රකට වූ ද්‍රවිඩ ආභාසය මහනුවර යුගයේ අවසානය වන විට පෙර නොවූ විරූ අයුරකින් සිංහල සාහිත්‍යයේ අංග ලක්ෂණයක් වීමට හේතුව උඩරට රජ පෙළපතෙහි අවසාන නරපතීන් හතරදෙනා ද්‍රවිඩ නායක්කර් වංශිකයන් වීම නිසා බව සිතිය හැකිය.

ද්‍රවිඩ සාහිත්‍යයේ ආභාසය ලබමින් ලංකා ජන සාහිත්‍යයට එක් වූ ගරා මඩු, දෙවොල් මඩු, හා පාන් මඩු වැනි ශාන්තිකර්මයන්ගේ එන කෝල්මුර කවි ආදිය අධ්‍යයනයේ දී දකුණු ඉන්දීය සමාජගත තොරතුරු හා සිංහල සාහිත්‍යයට එක් වී ඇති, ආගමික විශ්වාසයන් මත ගොඩනැගුනා වූ ද්‍රවිඩ සාහිත්‍යය ආගමනය වූ ආකාරය හඳාරන්නට හැකියාවක් ලැබීම ද මෙම අධ්‍යයනයේ දී විශේෂ විය.

**ප්‍රමුඛ පද :- සිංහල සාහිත්‍ය, ද්‍රවිඩ ආභාසය**